දෙකටම නැති සිංහල

ඩී බී කුරුප්පු

පත්තරය කියවන්නට පෙර උඩින් පල්ලෙන් පෙරලා බැලුවෙමි. විනෝදජනක මාතෘකාවක් අල්ලා ගන්නට වැඩි වේලාවක් ගියේ නැත.

නිරිඇල්ලයෝ සමු ගනිති.

ලොකු කළු අකුරෙන්. සම්පූර්ණ මාතෘකාවට තව උඩින් ජේලි දෙකක්.

සාක්කි නැති මරණ වෙනුවෙන් පෙනී සිටි නිරිඇල්ලයෝ සමු ගනිති.

මෙම වචන කිහිපයේ රසට තව ටිකක් නොකියවා බැරි ය. ටික දුරක් යන විට මට වඩා පුරුදු නමක්. මහාචාර්ය නන්දදාස කෝදාගොඩයාණෝ..

මෙහෙම විනෝදජනක යමක් දකින විට මට මතක් වන චරිතයක් ඇත. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දී මට මුණ ගැසුණ විචිත්‍රතම චරිතය. මුල්ලපිටියේ කේ එච් ද සිල්වා විජයශ්‍රීවර්ධන. වැඩි දෙනා මුල්ලපිටියේ නමින් හැඳින්වූ කවියා. පත්තරයට ලියූ ලිපියක් නිසා විනය කඩ කිරීමේ වරදට දඬුවමක් නොලබා ඔහු ඊරුණු හැටි.. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ගැන ලියූ ලිපියක එහි ප්‍රධානියා ඔහු විසින් හඳුන්වනු ලැබුණේ කොමසාරිසා යනුවෙනි. ඔහුට එරෙහිව විනයානුකූලව ක්‍රියා නොකිරීමට හේතු ඇතොත් දන්වන්නැයි ඉහළින් අණක් ලැබුණේ අර වචනය අපහාසයක් හැටියට සැලකූ නිසා ය. මුල්ලපිටියේ එක් පිළිතුරු ලිපියකින් චෝදනාව නිෂ්ප්‍රභා කරන්නට සමත් විය.

තමා කළේ කොමසාරිස් යන පදය ප්‍රථමා විභක්ති ඒක වචන රූපයෙන් යෙදීම පමණැකැයි කී මුල්ලපිටියේ එය කොමසාරිස් - කොමසාරිසා - කොමසාරිසෙන් ආදි වශයෙන් විභක්ති නමයටම වර නගා දැක්වී ය.

යට කී කොමසාරිසෝ යන ප්‍රථමා බහුවචන රූපය අනුවය මා නිරිඇල්ලයෝ යන්න දෙස බලන්නේ.. එපමණක් නොවේ. බොහෝ දෙනා ලියන කියන අමරදේවයෝ බඳු වචනයකද ඒක වචන රූපය කුමක්දැයි මම නිතර කල්පනා කරමි. නිරිඇල්ලයෝ යන්න කියවන විට පවා ඒක වචනය ගැන නොසිතා ම හාස්‍ය රසයක් විඳ ගැනීමට මම සමත් වෙමි. කෝදාගොඩයාණෝ කියන විට එම රසය තවත් තීව්‍ර වන්නේ ය.

මා මෙම නිදසුන උපුටා ගත්තේ 2006 මාර්තු 12 වැනි දා ඉරිදා දිවයින පත්තරයෙනි. ඉරිදා දිවයින අතට පත් හැම විටකම මා නොවරදවා කියවන ලිපියක් ඇත. සතිපතා මහාචාර්ය නලින් ද සිල්වා ලියන ලිපිය කියවන්නට මා පටන් ගත්තේ දැනට වසර එකහමාරකට පමණ උඩටදීය. ඔහුගේ සමහර අදහස් සීමාන්තික යයි මට හැඟී ගිය ද ඔහු ලියන හැම ලිපියක් ම දැඩි උනන්දුවකින් පරිස්සමින් කියවමි. ඉරිදා දිවයිනේ තබා එරට මෙරට පත්තර සගරා බොහොමයකින් දැකගත නොහැකි විදියේ නිවැරදි බස් වහරක් මහාචාර්ය නලින් ද සිල්වා ට ඇත. එම ලිපිය කියවන හැම විටකම මට සිහිපත් වන කරුණක් ඇත.සිංහල විශේෂ උපාධිධාරී ආචාර්ය මහාචාර්යවරුන් සමහර දෙනෙකු වරද්දන සිංහල, නිවැරදිව ලියන්නට ඔහු සමත් වන බවයි.

මා සඳහන් කරන සිංහල උගතුන් දෙතුන් දෙනෙකු හෝ අඳුනන මම මහාචාර්ය ද සිල්වා දැක නැත්තෙමි. ඔහු සිය උපාධිය සඳහා විෂයයක් වශයෙන් පවා සිංහල හදාරන්නට නැතැයි සිතන්නට මා යොමු වන්නේ ඔහු ගණිත විශේෂඥයකු වන හෙයිනි. විෘ විෂයයක් වෙත සිය අධ්‍යාපනය යොමු කළ විද්වතෙකුගෙන් සිංහල ව්‍යාකරණය පිළිබඳ හසල දැනුමක් පැතිය හැක්කේ කලාතුරකිනි. එබන්දන් නැතුවාමත් නොවේ.

වියරණය රකිමින් ලියන්නට තරම් ශික්ෂණයක් මහාචාර්ය නලින් ද සිල්වා

> *වියරණ නොතකා කට වහර අනුව ලිවීම තේරුම් ගැනීමට මම සමත් වෙමි. එහි ද වියරණයක් නොහොත් ශික්ෂණයක් ඇත. එහෙත් ඉහත කී විදියේ කටුවට වහල්ලට දෙකටම නැති බස් වහර නම් කෙබන්දක්දැයි තේරුම් ගන්නට බැරි ය.*

වෙතින් ප්‍රකට වීම අගය කරන මට වටහා ගත නොහැක්කේ ඔහු දක්වන එම සත්කාරය පොත පත ලියන පුවත්පත් කලාවේ නිරත බොහෝ සිංහලයනගෙන් බසට නොලැබෙන්නේ ඇයි ද යන්න ය. ඉංගිරිසියෙන් පොතක් ලියන ලේඛකයන් තමාගේ බස් වහර වෙනත් උගතකු ලවා නිවැරදි කරවා ගත් බව පෙරවදනෙහි සඳහන් කරන සැටි මා දැක ඇත. සිංහල ලේඛකයන් එසේ කරන කියන අවස්ථා අතිශය විරලය. එසේ දුටු එක් නිදසුනක් මට මතකය. සම්මාන ලාභී කෙටිකතා කරුවකු වූ (ලෙවි) අපිත් කළ්‍යාණ අමරසිංහ තමාගේ පොතක එසේ සඳහන් කළේ යයි සිතමි. බටහිර වෙදකම පුහුණු කළ ද ඔහුත් වියරණ රැකීමට උත්සුක වන සිංහල ලේඛකයෙකි.

මහාචාර්ය නිරිඇල්ල ගැන කියවා මහාචාර්ය නලින් ද සිල්වාගේ ලිපියක් කියවූ මම නාගසේන ගේ දේශපාලන විග්‍රහය වෙතට යොමු වූයෙමි. පළ පුරුදු පුවත්පත් කලාවේදියෙකැයි සිතිය හැකි ඔහුගේ සිංහල ඊට කලින් ද මට විනෝදයක් සපයා ඇති හෙයිනි. ඔහු කරන විග්‍රහය මහාචාර්ය නලින් ද සිල්වා ගේ බඳු තියුණු විශ්ලේෂණයක් නොවේ. සතියේ දේශපාලන හැල හැප්පිලි වාර්තා කිරීමක් පමණි. මා සිත් ගත් නිදසුන් කිහිපයක් මෙසේ ය.

1 තම ප්‍රධාන ආරක්ෂක නිලධාරියාට කතා කළ මහින්ද ඔහු ද කැටිව හෙලිකොප්ටරයක නැගී නුවර ගිය හ.

2 නුවර දී ..... ලුතිනන් අබේරත්නගේ ගෙදරට ගොඩ වූ හ.

3 ජනාධිපති මහින්ද ..... මල්වතු අස්ගිරි මහා විහාරවලට ගියේ ය.

4 සඳදා උදෑසන ජනාධිපති මහින්ද රාජපක්ෂ සිය මාධ්‍ය ප්‍රධානීන් සමග කතා බහ කරමින් සිටිය හ.

ඉහත සඳහන් 1, 2 සහ 4 වැනි වාක්‍ය වල ආඛ්‍යාතය බහු වචනයෙන් යොදන ලද්දේ ජනාධිපතිට ගෞරවයක් වශයෙන් යයි කිව නොහැක්කේ තුන්වැනි වැකියේ එබඳු ගරු සරුවක් නොදැක්වෙන හෙයිනි. අංක 1 දරන නිදසුනෙහි කැටිව යන්න යතුරු ලියනයේ දොසක් ලෙසින් ගත හැකි වුව ද අනෙක් තුන් පළක ක්‍රියාව ගැන එසේ කිව නොහැකි ය.

උක්ත - ආඛ්‍යාත සම්බන්ධය පිළිබඳව තවත් නිදසුනක් එම ලිපියෙන් ම.

සිරිසේන කුරේ පිළිබඳ අප්‍රසාදය එක්සත් ජාතික පක්ෂයේ පතුල බිඳගෙන අවසින් දවස පැන නැගෙන්නට වූහ.

උක්තානුක්ත භේදය පිළිබඳ නිදසුන් දෙකක් ද එම ලිපියෙන්ම උපුටා දක්වමි.

1 ඔවුහු ගිවිසුමේ සංශෝධනය කරන කොටස් වහාම පක්ෂ නායකයන්ට හා රටට හෙළි කරන ලෙස ය.

2 ඔහු එසේ ගියේ... තරග වදින අපේක්ෂකයෝ 322 හා කතා බහ කිරීමට ය.

වියරණ නොකතා කට වහර අනුව ලිවීම තේරුම් ගැනීමට මම සමත් වෙමි. එහි ද වියරණයක් නොහොත් ශික්ෂණයක් ඇත. එහෙත් ඉහත කී විදියේ කටුවට වහල්ලට දෙකටම නැති බස් වහර නම් කෙබන්දක්දැයි තේරුම් ගන්නට බැරි ය.

5 වන පිටෙන්

පැහැති ගිරි කුලක පපු පෙදෙස මත එල්ලා වැටෙන මැණික් එබ්බවූ මාලයක් මෙන් දිළිසෙන කුඩා දිය ඇළ්ලකි. දිය ඇළ්ල පාමුල කුඩා දියමන්ති කුඩු විසිරුවා ඇත්තාක් මෙන් බැබළෙන ගිරු රැ ස් හා ඉරී ගිය නන් පැහැ ගත් කොඩියක් මෙන් ඒ හරහා ඇඳුණ දේදුන්නක පැතිකඩකි. හාත්පසින්ම වූයේ මල් සමුදායක් පුබුදුවාගෙන එන කොල ප්‍රවාහයකි. හිසට උඩින් අහස හරහා රීදී පැහැති උල්කාපාතයක් මෙන් හුදකලාව නිහඬව පියඹා ගියේ දැකුම්කළු හිම සුදු පැහැති පක්ෂියෙකි.

ආලෝකය කෙමෙන් මැකී යන තෙක්ම මම එහි රැ ඳී සිටියෙමි. මොහොතකට බටහිර අහස තද රතු ප්‍රභාවක ගිලී ගියේය. මුහුද කහ පැහැ-යට හැරුණි. වෙරළ පෞරාණික රන් පැහැ ගති. තවත් මොහොතකින් දම් පැහැති ගොම්මන් එළිය සියල්ල වසා පැතිරුණි. අහස නැවතත් අසංඛ්‍යාත වූ තරු රාශියෙන් පොළවට මල් ඉසින්නට පටන් ගති. සමහර තරු පොකුරු මුහුදු මතුපිට ගින්දර වැනි ඊබා සටහන් මැවීය. මම ද ආපසු හැරී, කැරලිකාර ලෙස දසත ඇදී, දැවෙන ඉඟුරු සහ වේවැල් පඳුරු සමග ඈඳි පැටලී තිබුණු ලිය වැලින් ගහණ කැලෑ රොද ඔස්සේ රැ පිපෙන පතොක් මල් ගලා හැලෙන සඳ කිරණට ආසිරි පතන්නට මෙන් සිය ඇත්දළ බඳුන් විවර කරද්දී හොල්මන් අවතාර පිරී ඇත්තාක් බඳු වූ පොල් රුප්පාවන් යටින් යන්නට ගියෙමි. ගම් පියසට ළඟා වෙද්දී බාලිකාවන් මුදු හඬින් ගැයූ ආගන්නුක ගී සහ තැනින් තැන මතුවී ගස් අතු පතර අතරින් තරු දෙසට ඇදුණ නිල් පැහැති දුම් කැරලි මා තවම මිහි පිට සිටින බව මට කියා පෑවේය.

ලේඛකයා විසින් සටහන් කරන්නට යෙදුණු ලංකා ඉතිහාසය පිළිබඳ තොරතුරු ඊළඟ කලාපයෙන් කියවමු.

සන්නස අන්තර්ජාලයෙන්
www.sannasa.net

FOR ALL YOUR ARCHITECTURAL DESIGNS
OSHarc_tec Designs
BUILDING DESIGNERS OF THE NEXT GENERATION
ABN: 87 757 811 673
SRILANKA
NEW HOUSE
EXTENSIONS
RENOVATIONS
INTERIOR
OFFICE BUILDINGS
INDUSTRIAL BUILDINGS
MELBOURNE

OSHAN N.C. PERERA Director
Dip. Civ. Eng. (SL), BArch (UNSW)
1/53-57 SECOND AV, CAMPSIE, NSW-2194
PH: 02 9718 0273.....MOB: 0422 862 898
EMAIL: oshanperera@optusnet.com.au
SYDNEY